# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2327/35 - 2023 අප්‍රේල් මස 12 වැනි බදාදා - 2023.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**එල්. ඩී. බී. 4/2011**

විධාන අංකය :- 89

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(II) වන වගන්තිය යටතේ වන විශේෂ විධානය

2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපති, ශාන්ත නිරිඇල්ල වන මා විසින්, පාරිභෝගිකයාගේ ආරක්ෂාව සඳහා, යම් සෘජු විකුණුම්කාර වෙළෙන්දකු විසින් මෙහි උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ, සාකච්ඡා කිරීම හෝ ආදර්ශනය කිරීම මගින් විකිණීම සඳහා අර්පණය කිරීමට, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීමට, විකිණීම සඳහා ප්‍රචාරණය කිරීමට, විකිණීම සඳහා ප්‍රවර්ධනය කිරීමට හෝ විකිණීම සඳහා ඇණවුම් භාරගැනීමට හෝ භාණ්ඩ විකිණීමට -

1. (අ) එකී සෘජු විකුණුම්කාර වෙළෙන්දාගේ ලියාපදිංචි ලිපිනය පදනම් කරගත්, අවස්ථාවෝචිත පරිදි, ව්‍යාපාර නාම ලියාපදිංචි අංකය හෝ සමාගම් ලියාපදිංචි අංකය ඉදිරිපත් කර, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වෙළෙන්දකු වශයෙන් ලියාපදිංචි විය යුතු බව ;

(ආ) ඔහු වෙත අනු පිටපත රඳවා තබා ගත යුතු වූ

(I) කුවිතාන්සි හෝ බිල්පත් අංකය ;

(II) ගනුදෙනුවේ ස්වභාවය ; සිල්ලර හෝ තොග වෙළෙඳාම ද යන්න ;

(III) ගනුදෙනුව සිදු කළ දිනය ;

(IV) විකුණන ලද භාණ්ඩ වර්ගය ;


1A - PG 6289 — 81(2023/04)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(V) විකුණන ලද භාණ්ඩ ප්‍රමාණය ;

(VI) විකුණන ලද භාණ්ඩ ඒකකයක වටිනාකම ;

(VII) විකුණන ලද භාණ්ඩවල මුළු වටිනාකම ;

(VIII) කාණ්ඩ අංකය, ඇත්නම් ;

(IX) වගකීම් අංකය ඇත්නම් ;

(X) පාරිභෝගිකයාගේ නම සහ ලිපිනය ; සහ

(XI) වෙළෙන්දකු විසින් කුවිතාන්සි නිකුත් කිරීම සම්බන්ධයෙන් යම් ලිඛිත නීතියක් යටතේ පනවනු ලබන වෙනත් යම් විධාන.

ඇතුළත් මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික ආකෘතියේ වූ කුවිතාන්සියක් හෝ බිල්පතක් පාරිභෝගිකයකු වෙත නිකුත් කළ යුතු බව ;

(ඈ) වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමේ දී හෝ ප්‍රචාරණය කිරීමේ දී හෝ පෙනී සිටිමින් භාණ්ඩ මිල දී ගන්නා ලෙසට පාරිභෝගිකයන්ගෙන් ඉල්ලා සිටීමේදී ව්‍යාපාර හෝ වෙළෙඳ නාමය, වෙළෙන්දාගේ නම, ලිපිනය, දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය, නිෂ්පාදිතයේ ස්වභාවය, එම නිෂ්පාදිතය භාවිත කිරීම පිළිබඳ උපදෙස්, වගකීම් කාලය, විකුණුම් මිල, ණය ගෙවීම් හෝ වාරික ගෙවීම් ක්‍රම, පහසු ගෙවීමේ ක්‍රම පිළිබඳ විධාන, වගකීම් සහ අලෙවියෙන් පසු සේවා පිළිබඳ විධාන එහි ප්‍රවර්ධන හෝ වෙළෙඳ දැන්වීමේ ඇතුළත් විය යුතු බව ;

(ඇ) විද්‍යුත්, ලිඛිත හෝ වෙනත් යම් මාධ්‍යයක් හරහා ප්‍රවර්ධනය හෝ ප්‍රචාරණය කිරීමේ දී පාරිභෝගිකයකු, රවටන හෝ නොමග යවන සුළු ආකාරයට යම් ප්‍රකාශයක්, ලිපිනයක් හෝ ලිපිනයක විස්තර, ආදර්ශනය කිරීම්, ප්‍රදර්ශනය කිරීම්, පැහැදිලි කිරීම්, දුරකථන අංක, විද්‍යුත් තැපැල් ලිපින, ලේබන, ඡායාරූප හෝ වීඩියෝ පට භාවිත නොකළ යුතු බව ;

(ඉ) විකිණීමට පෙර පාරිභෝගිකයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට සුවිගත ආකෘති පත්‍රයක් ලබා දෙන්නේ නම්, එකී ආකෘති පත්‍රයට, වගකීමේ හෝ ප්‍රතිඥාභාරයේ කොන්දේසි, අලෙවියන් පසු සේවා පිළිබඳ විස්තර සහ සීමා, වගකියන තැනැත්තාගේ නම සහ ලිපිනය, වගකීම් සහතිකය බලාත්මක වන කාලසීමාව, පාරිභෝගිකයකුට හෝ වෙනත් තැනැත්තකුට ඇති ප්‍රතිකර්ම යෙදිය හැකි ක්‍රම, සමාගමේ සහ ඍජු විකුණුම්කාර වෙළෙන්දාගේ සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, දුරකථන අංකය සහ විද්‍යුත් තැපැල් ලිපිනය කියවිය හැකි සහ තේරුම්ගත හැකි පරිදි පැහැදිලිව ඇතුළත් විය යුතු බව ;

(ඊ) පාරිභෝගිකයකු විසින් සිදු කරන ලද යම් ඇණවුමක් දින හතක කාලයක් ඇතුළත අවලංගු කිරීමේ හිමිකම සහතික විය යුතු බව

මෙයින් විධානය කරනු ලැබේ.

2. මේ විශේෂ විධානයේ කාර්යය සඳහා -

''ඍජු විකුණුම්කාර වෙළෙන්දා'' යන්නෙන් පාරිභෝගිකයන් මුණගැසී සාකච්ඡා කිරීමෙන්, ප්‍රදර්ශනය කිරීමෙන්, ආදර්ශනය කිරීමෙන් හෝ වෙනත් සමාන ක්‍රියා මගින් ජංගම වෙළඳාමක් ආකාරයෙන් භාණ්ඩ විකිණීමේ නිරත වන තැනැත්තකු අදහස් වන අතර, ඊට -

(අ) භාණ්ඩ විකිණීමේ ක්‍රියාවෙහි නිරත වීමෙන් හැර වෙනත් යම් ක්‍රමවලින් මුදල් උපයන ; සහ

(ආ) 1988 අංක 30 දරන බැංකු පනතෙහි 83ඇ වගන්තිය යටතේ යෝජනා ක්‍රමයකට සම්බන්ධව සිටින.

තැනැත්තකු අයත් නොවේ.

**උපලේඛනය**

(I) සූර්යබල ආලෝක පද්ධති

(II) දුරකථන සහ උපාංග

(III) ගෘහභාණ්ඩ

(IV) පිරිසිදුකාරක

(V) සපත්තු

(VI) ලිපිද්‍රව්‍ය

(VII) මුළුතැන්ගෙයි උපකරණ සහ උපාංග

(VIII) ඇඳ ඇතිරිලි සහ මෙට්ට

(X) නිමි ඇඳුම්

**ශාන්ත නිරිඇල්ල,**
සභාපති,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

2023 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0084/1

---

**එල්. ඩී. බී. 4/2011**

විධාන අංකය :- 90

**2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10(1)(ආ)(ii) වන වගන්තිය යටතේ විශේෂ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශාන්ත නිරිඇල්ල වන මා විසින්, පාරිභෝගිකයාගේ ආරක්ෂාව සඳහා, පාරිභෝගිකයකු සමග සාකච්ඡා කිරීම, ආදර්ශනය කිරීම හෝ ඒ හා සමාන ක්‍රියාවක් සිදු කිරීම මගින්, විකිණීම සඳහා අර්පණය කරනු ලබන, විකිණීම සඳහා ප්‍රදර්ශනය කරනු ලබන, විකිණීම සඳහා ප්‍රචාරණය කරනු ලබන, විකිණීම සඳහා ප්‍රවර්ධනය කරනු ලබන, විකිණීම සඳහා ඇණවුම් භාරගනු ලබන හෝ යම් භාණ්ඩ විකුණනු ලබන ජාල අලෙවිකරණයෙහි නිරත වන සමාගමක් හෝ අස්ථිත්වයක් විසින් -

1. (අ) පදිංචි ස්ථානයේ ලිපිනය පදනම් කරගනිමින්, අවස්ථාවෝචිත පරිදි, එකී වෙළෙන්දාගේ ව්‍යාපාර නාම ලියාපදිංචි අංකය හෝ සමාගම් ලියාපදිංචි අංකය ඉදිරිපත් කරමින්, රුපියල් විසිපන්දහසක වාර්ෂික ගාස්තුවක් ගෙවීම මත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ වෙළෙන්දකු වශයෙන් ලියාපදිංචි විය යුතු බව ;

(ආ) ඔහු වෙත අනු පිටපතක් තබා ගත යුතු වන,

(I) කුවිතාන්සි හෝ බිල්පත් අංකය ;

(II) ගනුදෙනුවේ ස්වභාවය ; සිල්ලර හෝ තොග ද යන්න ;

(III) ගනුදෙනුව සිදු කළ දිනය ;

(IV) විකුණන ලද භාණ්ඩ වර්ගය ;

(V) විකුණන ලද භාණ්ඩ ප්‍රමාණය ;

(VI) විකුණන ලද භාණ්ඩ ඒකකයක වටිනාකම ;

(VII) විකුණන ලද භාණ්ඩවල මුළු වටිනාකම ;

(VIII) කාණ්ඩ අංකය, ඇත්නම් ;

(IX) වගකීම් සහතික අංකය, ඇත්නම් ;

(X) පාරිභෝගිකයාගේ නම සහ ලිපිනය ; සහ

(XI) වෙළෙන්දකු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සි සම්බන්ධයෙන් වෙනත් යම් ලිඛිත නීතියක පනවනු ලැබ ඇති වෙනත් යම් විධාන.

ඇතුළත් මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික කුවිතාන්සියක් හෝ බිල්පතක් පාරිභෝගිකයකු වෙත නිකුත් කළ යුතු වන බව ;

(ඇ) වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමේ දී සහ ප්‍රචාරණය කිරීමේ දී හෝ පෙනී සිටිමින් භාණ්ඩ මිල දී ගැනීමට ඉල්ලා සිටිමේදී, එකී ප්‍රවර්ධනය කිරීමට හෝ ප්‍රචාරණය කිරීමට, ව්‍යාපාරයේ හෝ වෙළඳාමේ නම, වෙළෙන්දාගේ හෝ අනෙක් තැනැත්තාගේ නම, ලිපිනය, දුරකථන අංකය සහ ඊමේල් ලිපිනය, නිෂ්පාදනයේ ස්වභාවය, එකී නිෂ්පාදනය භාවිතය සඳහා උපදෙස්, වගකීම් කාලය, විකුණුම් මිල, ණය ගෙවීම් හෝ වාරික වශයෙන් ගෙවීම්, පහසු ගෙවීමේ ක්‍රම සඳහා උපදෙස්, වගකීම පිළිබඳ උපදෙස් සහ විකිණීමෙන් පසු සේවා පිළිබඳව ඇතුළත් කළ බව ;

(ඈ) වෙළඳාම ප්‍රවර්ධනය කිරීමේ දී සහ ප්‍රචාරණය කිරීමේ දී, පාරිභෝගිකයකු රවටන සුළු හෝ නොමග යවන සුළු යම් ප්‍රකාශයක්, ලිපිනයක් හෝ ලිපිනයක විස්තර, ආදර්ශනය කිරීමක්, ඉදිරිපත් කිරීමක්, පැහැදිලි කිරීමක්, දුරකථන අංකයක්, ඊමේල් ලිපිනයක්, ලේඛනයක්, ඡායාරූපයක් හෝ වීඩියෝ පටයක් යොදා නොගත යුතු බව ;

(ඉ) විකිණීම සිදු කිරීමට පෙරාතුව පාරිභෝගිකයකු වෙත සූචිගත ආකෘති පත්‍රයක් ලබා දෙන්නේ නම්, වගකීමේ හෝ ප්‍රතිඥාභාරය පිළිබඳ කොන්දේසි, විකිණීමෙන් පසු සේවා පිළිබඳ විස්තර සහ සීමා, සහතිකකරුගේ නම සහ ලිපිනය, සහතික වීම බලාත්මකව පවතින කාලය, පාරිභෝගිකයකු හෝ වෙනත් තැනැත්තකු සඳහා ප්‍රතිකර්ම යෙදිය හැකි ක්‍රම, ජාලගත අලෙවිකරණයේ නිරතව සිටින වෙළෙන්දාගේ සම්පූර්ණ නම. ස්ථිර ලිපිනය, දුරකතන අංකය සහ ඊමේල් ලිපිනය, කියවිය හැකි පරිදි සහ තේරුම්ගත හැකි පරිදි එකී සූචිගත ආකෘති පත්‍රයට පැහැදිලිව ඇතුළත් කළ යුතු බව ;

(ඊ) ඇණවුමක් සිදු කරන ලද දිනයේ සිට දින හතක කාලයත් ඇතුළත එකී ඇණවුම අවලංගු කිරීම සඳහා පාරිභෝගිකයකුට හෝ වෙනත් තැනැත්තකුට ඇති අයිතිය සහතික විය යුතු බව,

මෙයින් විධානය කරනු ලැබේ.

**2.** මේ විශේෂ විධානයේ කාර්යය සඳහා -

''ජාලගත අලෙවිකරණය'' යන්නෙන්, යම් තැනැත්තකු විසින්, විකුණුම් ප්‍රවර්ධන හෝ පරිශීලක නිර්දේශ හරහා සහ නිෂ්පාදන ප්‍රචාරණය කරමින්, නව පාරිභෝගිකයන් මුහුණට මුහුණ ලා හමුවීම මගින් -

(අ) එකී නැතැන්තා හඳුනාගත් යම් නිශ්චිත පාරිභෝගිකයකු වෙත ; හෝ

(ආ) අවස්ථාවෝචිත පරිදි, අනුයෝජිතයකු වශයෙන් එකී නිශ්චිත පාරිභෝගිකයා හෝ වෙනත් ස්වාධීන නියෝජිතයකු හඳුන්වාදෙන ලද යම් අලුත් පාරිභෝගිකයකු විසින් මිල දී ගන්නා විකුණුම් වටිනාකම මත පදනම්ව එකී තැනැත්තාගෙන් කොමිස් මුදලක් ලබාගන්නා වූ එකී නිශ්චිත පාරිභෝගිකයා හෝ ස්වාධීන නියෝජිතයා නිරත කරවීම මගින්,

භාණ්ඩ විකිණීම අදහස් කෙරේ.

එයට -

(අ) භාණ්ඩ විකිණීමේ කාර්යයේ නිරත වීම මගින් හැර වෙනත් ක්‍රමවේදවලින් මුදල් එකතු කරනු ලබන තැනැත්තකු ;

(ආ) ජාලයකට එක්වීම සඳහා ගාස්තුවක් අය කරනු ලබන තැනැත්තකු ;

(ඇ) කොමිස් මුදල් වැඩි වාර ගණනක් ලබාගනිමින්, භාණ්ඩවල සඳහන් කරනු ලැබ ඇති මිල ඉක්මවනු ලබන මිලකට එකී භාණ්ඩ විකුණනු ලබන යම් තැනැත්තකු ; හෝ

(ඈ) 1988 අංක 30 දරන බැංකු පනතේ 83ඇ වගන්තිය යටතේ වන යෝජනා ක්‍රමයක නිරත වනු ලබන තැනැත්තකු,

ඇතුළත් නොවේ.

''ජාලගත අලෙවිකරණයේ නිරතවනු ලබන වෙළෙන්දා'' යන්න, ''ජාලගත අලෙවිකරණය'' යන පදයේ අර්ථනිරූපණය ප්‍රකාරව තේරුම්ගත යුතු ය.

**ශාන්ත නිරිඇල්ල,**
සභාපති,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.

2023 අප්‍රේල් මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0084/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.